සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

**නම/විභාග අංකය :- ............................................................** **කාලය: පැය 02 යි.**

I කොටස

- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

---

- 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැන සම්පූර්ණ කරන්න.

(01) ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය ...................................................... යි. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ පළාත/ ග්‍රාම නිලධාරී කොට්ඨාසය)

(02) උතුරු දිශාව හා නැගෙනහිර දිශාව අතර ...................................................... දිශාව පිහිටා ඇත. (මධ්‍යම / නැගෙනහිර/ ඊසාන)

(03) සුළඟේ වේගය මනිනු ලබන්නේ ...................................................... වලිනි. (පැයට සැතපුම්/ පැයට කිලෝමීටර්/ මිලි මීටර්)

(04) යම්කිසි රටක අවට පිහිටි රටවල් මුහුදු හා සාගරවල පිහිටීම සම්බන්ධ කරමින් ..................................................පිහිටීම ගත හැකිය. (නිරපේක්ෂ/ සාපේක්ෂ/ මධ්‍යස්ථ)

(05) ගස්වල බීජ ව්‍යාප්තියට ..................................................සහය වෙයි. (ගිරවා/ වේයා/ වවුලා)

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(06) ග්‍රීන්ලන්තය ලෝකයේ පිහිටි විශාලතම දූපතයි. ( )

(07) වායුගෝලයේ පවත්නා වායු වර්ග අතුරින් ශාක වර්ධනයට අවශ්‍ය වන්නේ නයිට්‍රජන් වායුවයි. ( )

(08) කඳුකර ප්‍රදේශවල වී වගාව පහසුවෙන් සිදුකළ හැකි වේ. ( )

(09) මොනරා සංචාරක පක්ෂියෙකි. ( )

(10) දිරාපත් නොවන ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම හානිකරය. ( )



LIVEWORKSHEETS

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ආකාරයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට ඇති අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

(11) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන මුහුදු තීරය වන්නේ,
(1)අරාබි මුහුද (2) බෙංගාල බොක්ක
(3)පෝක් සමුද්‍ර සන්ධිය (4) මලක්කා සමුද්‍ර සන්ධිය ................

(12) වේවැල් භාණ්ඩ සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයක් වන්නේ,
(1)මොරටුව (2) අම්බලන්ගොඩ
(3)රදාවඩුන්න (4) දුම්බර ................

(13) ෆැරන්හයිට් හා සෙල්සියස් යන ඒකක වලින් මනිනු ලබන්නේ,
(1)වර්ෂාපතනය (2) උෂ්ණත්වය
(3)ආර්ද්‍රතාව (4) උස ................

(14) කොළඹ දිස්ත්‍රික්කය අයත් පළාත කුමක් ද?
(1)බස්නාහිර (2) දකුණ
(3)ඌව (4) නැගෙනහිර ................

(15) භූමිය අයහපත් ලෙස පරිහරණය කිරීම නිසා ඇති වන අයහපත් ප්‍රතිඵලයකි.
(1)සුනාමි (2) භූමි කම්පා
(3)නියඟ (4) නායයෑම් ................

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) බෝග වගා කිරීම, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය යනාදිය අයත් වන්නේ ............................................................ කටයුතු වලටයි.

(17) නිවැරදිව දිශාව හඳුනා ගැනීම සඳහා ...................................................................................................... යන්ත්‍රය භාවිත කෙරේ.

(18) ජල වාෂ්ප ........................................................................... වීමෙන් වළාකුළු නිර්මාණය වේ.

(19) වළං,උළු හා ගඩොල් වැනි නිෂ්පාදන යොදා ගනු ලබන අමු ද්‍රව්‍ය වන්නේ ..................................................................ය.

(20) අතීත වාරි ශිෂ්ටාචාරයේ කේන්ද්‍රස්ථානය ....................................................................................යි.

(ලකුණු 2×20= 40)



LIVEWORKSHEETS